කෙටි කතාව

# ජාතික ඇඳුම



පියාණන් හා බැඳුනු මගේ ජීවිතය කුඩා අවධියේ සිදු වූ සිද්ධියක් සිහිවන වාරයක් පාසාම මට දැනෙන්නේ සියුම් කටුවකින් මගේ හදවතට අනින විට මෙන් දැනෙන වේදනාවකි. විවාහයෙන් පසු ගමෙන් පිටවී සැමියා හා දරු මල්ලන් සමගින් වෙන පලාතක පදිංචිව සිටින මා හට අතීත ආවර්ජනා අතර සැරිසරනා කල්හි ඒ සිද්ධිය එලෙස සිදු නොවුණා නම් යයි සිතුන වාර නිමක් නැත.

දිය යට සඟවන්න තැත් කරන රබල් බෝලයක් යලි උඩට මතු වී එන්නා සේ යටපත් කරගන්නට හදන එම අමිහිරි සිදුවීම මගේ මතකයට නැග එන්නේ තාත්තා පිළිබඳ කිසියම් දුක්බර මතක ශේෂයක් ද මා ගැනම උපන් සියුම් කලකිරීමක් ද හදවතේ කොනක ඉතිරි කර ගනිමිනි. දැනුදු සුදු ජාතික ඇඳුම ඇඳි තලතුනා පද්ගලයෙකු මුණ ගැසෙන වාරයක් පාසාම සිහිපත් කරන්නට අකමැති ඒ සිදුවීම සියලු හැඟීම් අභිබවා ඉදිරියට විත් මගේ හෘද සාක්ෂියට අභියෝග කරමින් හැම විටම අවි අමෝරාගෙන සිටින බව පමණක් මට දැනේ.

ගුරුවරයෙකු වූ මගේ පියා අප ජීවත් වූ සීතාවක කොබෝතුරා කුඳු යාය පෙනෙන මානයේ පිටිසර ගම් පියසට යාබද මැදි මහ විදුහලේ සේවය කරද්දී මමත් මගේ අනෙක් සොයුර සොයුරියනුත් එම විදුහලේ පහළ පංතිවල ඉගෙනුම ලැබීමු.

මනස්කාන්ත ස්වභාවික නිවර්තන වනාන්තරයෙන් විසිතුරු වූ මානියම්ගම කෙබෝතුරා කඳු යායට හිරු දෙවි වඩිද්දී සුදෝ සුදු ජාතික ඇඳුමින් සැරසී කළු සපත්තු පැළඳ පොත් පත් බහා ලූ වේවැල් කූඩයක් ඉදිරිපස රැඳි පා පැදියේ නැග තාත්තා නියර දිගේ ඇති කෙටි පාරෙන් කොළඹ කෑගල්ල මහාමාර්ගයට පිවිසෙයි. ඒ හා සමගම අපි ද තාත්තා පසුපසින් පයින් ඇවිද විත් බස් රියේ නැග තල්දූව හන්දියේ බැස පාලම මතින් සීතා නදිය තරණය කර විදුහලට ගියෙමු. ඒ යන අතරතුරදී පාලම යටින් පෙනෙන නදී කුමරියගේ හැඩරුව නැරඹීමට අප පාලම ළඟ මදක් නතර වෙද්දී අප පසුපසින් පැමිණි තාත්තා අපට තරවටු කර අපෙන් එකෙකු පාපැදයේ ඉදිරිපස නංවාගෙන විදුහල වෙත යලි පදියි.

හැත්තෑව දශකයේ අග භාගයේදී අප විදුහලේ උගැන්වූ ගුරුවරු කීප දෙනෙක්ම දිනපතා විදුහලට පැමිණියේ මෝටර් රථ වලිනි. දැන් මෙන් නොව එකල ගුරුවරුන් හට එවැනි සමාජ තලයක ජීවත් වීම එතරම් අසීරු කාරණයක් නොවිණ. ඒ අයට මෙන් මගේ පියාට මෝටර් රථයක් නොතිබුණද ඉඳහිට නෑදෑ ගමනක් යාමට, චිත්‍රපටයක් හෝ නාට්‍යයක් බලන්නට යාමට අපට අසනීප වූ විට බේත් ගන්නට යාම වැනි පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා කුලී රථයක් ගෙන්වා ගැනීමට ඔහුගේ පඩිපත ප්‍රමාණවත් විය.

රණතුංග සර්ගේ කහ පැහැති වොක්ස්වගන් රථයට ඉඩදී පාලම අසළදී තාත්තා සිය පා පැදිය අයින් කර ගනිද්දී ඒ දුටු මගේ සිතේ ඇති වූයේ තාත්තා පිළිබඳ කිසියම් අවතක්සේරු සහගත හැඟීමකි. විදුහල් ගේට්ටුවෙන් ඇතුළු වී ශිෂ්‍ය පිරිස අතරට මැදිව පන්ති කාමරයට දිව යද්දී ගුරු භවතුන්ගේ කාර් පේලිය අතරේම අයිනේ ගසකට හේත්තු කර තිබූ ඔහුගේ පාපැදිය හඳුනාගත්ත මා සිත තුළ ඇති වූයේ දුකකි. උදෑසන මීදුම් පටලයන් හාත්පස කඳු මුදුන් වසා සිටිද්දී අපේ ගමේ නිල්වන් කෙත් යාය මැද්දෙන් පාසල් යන්නට පාරට වට තාත්තා දුටු ගැමියෝ ගෞරව සම්ප්‍රයුක්ව,

''ඉස්කෝලේ මහත්තයනෙ මේ"

යනුවෙන් පවසා ඔහුට පාර ඉඩ දෙද්දී මම ඔහු පිළිබඳව ආඩම්බර වීමි. එහෙත් මැදි මහ විදුහලේ ගේට්ටුවෙන් ඇතුල් වෙද්දී කලිසම් ඇඳ කාර්වලින් පාසලට පැමිණෙන අනෙක් ගුරුවරු අතරේ නැෂනල් කමිසය හා වේට්ටිය හැඳ පා පැදිය පැදගෙන පාසලට එන තාත්තා දැකීමෙන් හුලං ගිය බැලුම් බෝලයක් මෙන් සිත හැකිළේ.

තාත්තාට මෝටර් රථයක් නොමැතිවීම එතරම් අඩුපාඩුවක් සේ මා නොසැලකුවද තාත්තා තම සම වයසේ ඔහුගේ මිතුරන් මෙන් යුරෝපීය ඇඳුම් නාඳින්නේ අභවල් කාරණයක් නිසා දැයි මගේ සිත තුළ ඇතිවූයේ කුකුසකි. මම ඒ ගැන වරක් ඔහුගෙන් විමසීමි.

''තාත්තා ඇයි අපේ ඉස්කෝලේ වෙන සර්ලා වගේ කලිසම් අඳින්නෙ නැත්තේ ?"

හාන්සි පුටුවේ දිගෑදී පත්තරය කියවමින් සිටි තාත්තා කණ්නාඩිය යටින් අමුතු බැල්මක් හෙලා

''ඇයි කලිසම විතරද මට අඩුපාඩුවකට තියෙන් නේ" යයි ඇසීය. නැවත පත්තරය දෙසට නෙත් යොමු කළ ඔහු
''ගිහින් නවවරක් වක්කරේ පාඩම් කරගෙන එනවා"

යයි මට අණ දිණි. කරගත් මෝඩකම ගැන පසුතැවුණු මම හීන් සීරුවේ පසුබැස කුස්සියට ගොස් අම්මා ළඟ දැවටීමි. තාත්තාගෙන් ඇසූ පැනයම මම අම්මාගෙන් ද ඇසුවේ ඉස්තෝප්පුවට නෑසෙන පරිදිය. මට සරදම් සිනාවක් පෑ ඈ,

''තාත්තට කලිසම් අන්දවන්න ඔයා හිතුවා මදි. ඔයාලයේ ආච්චිටත් බැරි වෙච්චි කොට" යැයි කියා කතාව නතර කරන්නට සැරසුනාය. ඇය ආච්චි යැයි සඳහන් කළේ ඇගේ මව පිළිබඳවය.
''ඒ ඇයි ?"

දොර රෙද්ද දෙස විමසිලිමත් වූ අම්මා මඳ සිනාවක් පාමින් පහත් හඬින් මා හා දොඩමළු වූවාය.

''තාත්තා කලිසම් අඳින්නෙ නැති නිසා ඒ කාලෙ මාව තාත්තට කසාද බන්දලා දෙන්න ආච්චි කැමති වුනේ නෑ. ඒත් තාත්තා නෙමෙයි කලිසම ඇන්දේ. මාව කසාද බඳින්නට නොලැබුණත් නැෂනල් අඳින එකනම් නතර කරන්නේ නෑ කියලා ලියුමක් එවලා තිබුණා. හැබැයි තාත්තගෙ ඒ කතාව සීයගෙ හිතට නම් ඇල්ලුවා." යි අම්මා පැවසුවේ තාත්තා පිළිබඳ ගෞරවයකින් යැයි මට සිතිණි. එදයින් පසු මම ඇඳුම පිළිබඳ ප්‍රශ්නය අම්මාගෙන් හෝ තාත්තාගෙන් නෑසිමි.

ඔහු යුරෝපීය ඇඳුම ප්‍රිය නොකරන හේතුව මට වැටහුනේ මම වයසින් තරමක් මුහුකුරා ගිය විටය. ඒ කතාව තාත්තා විසින් ම නිවසට ආ ඔහුගේ සගයෙකුට අසා සිටි මම අතීතයේ ඔහු පිළිබඳව අර කමකට නැති සිතිවිලි මා තුල පහළ වූයේ මොන එහෙකටදැයි පසුතැවිලි වීමි. විශිෂ්ට සිංහල දැනුමකින් හෙබි ගුරුවරයකු වූ තාත්තාගේ ඉංග්‍රීසි පිළිබඳ දැනුම ඒ හා සම නොවුනද ඒ කාලයේ හැටියට යුරෝපීය ඇඳුම ඇඟේ ලා ගැනීමට තරම් එය ප්‍රමාණවත් විය. එහෙත් අනගාරික ධර්මපාලතුමා වැපිරූ සිංහල සිංහල බෞද්ධ පුනරුදයේ එලයන්හි සුවඳ ආඝ්‍රහනය කළ මගේ පියාගේ පරපුරේ ඇත්තෝ ජාතික ඇඳුම ඇඳීම මහත් ආඩම්බරයක් කොට සැලකූහ. තාත්තා සමග ඔහුගේ ළබැඳියන් කීප දෙනෙක්ම ජීවිතය කාලය පුරාම ජාතික ඇඳුම ඇඳීමේ ලා ගිවිස ගත්හ. එහෙත් යටත් විජිත මානසිකත්වයෙන් මිදීමට අපොහොසත් වීමෙන් කලිසම් කමිස ඇඟලා ගැනීමේ ආසාවෙන් පෙළුනු ලැබූ ඔවුහු ජාතික ඇඳුමේ ගිවිසුම බිඳ දැමූවද මපියාණෝ තම තිර ප්‍රතිපත්තියෙහි තදින්ම එල්බ සිටියහ.

තාත්තා ජාතික ඇඳුම ඇන්දේද කිසියම් වතාවතක් ඉටු කරන්නා සේ ක්‍රමානුකූලවය. ඔහු කඩයෙන් සවි ගෙන්වා ගෙන අම්මාට කියා කැඳ සාදාගෙන ඊට රොබින් නිල් ටිකක් මුසුකොට අනතුරුව පැල්ලම් නොසිටින සේ පරිස්සමින් එහි ඔබා අව්වේ වේලාගත් නැෂනල් සූට් කට්ටල් තමා විසින් ම මදින්නට සැරසෙන්නේ ඉරිදා සැන්දෑවේය. විදුලි බලය නොමැති එදවස ලොන්ඩ්‍රියේ පොල්කටු ඉස්ත්‍රික්කයෙන් මැද්ද විට තම සුදු ඇඳුම නාස්ති වේ යැයි විශ්වාස කළ ඔහු ඒ සඳහාම වයින් ස්ප්‍රීතු යොදා ක්‍රියා කරන ඉස්ත්‍රික්කයක් කොළඹින් ගෙන ආවේය. වරින් වර වතුර බිඳු ඉසිමින් රැලි නොසිටින සේ ඔහු ලතාවකට නැෂනල් ඇඳුම මැද ගන්නා අයුරු අපි වටවී බලා සිටියේ මහා බරපතල කාර්යයක් දෙස බලා සිටින ආකාරයෙනි.

එම සිද්ධිය වනවිට මම හතර පංතියේ සිසුවියක වී සිටි බව මට හොඳාකාරව ම මතකය. එදින විදුහලේ ප්‍රාථමික අංශයේ චිත්‍ර තරඟයක් විය. සෑම පංතියකින් ම චිත්‍ර ඇඳීමට දක්ෂ සිසුන් තෝරාගෙන දෙන ලද මාතෘකාව ඔස්සේ චිත්‍ර ඇඳීම ඔවුන්ට නියම වී තිබිණ. මගේ පංතියේ තේරුණු කීප දෙනා අතරට මම ද අයත් වීමි. අපගේ වයස් කාණ්ඩය සඳහා නියමිත මාතෘකාව වූයේ ''තාත්තා වැඩට යනවා" යන්නයි. බැලූ බැල්ලමට එය සරල තේමාවක් වුවද එය චිත්‍රයට නැගීමේ බැරෑරුම්කම මට අවබෝධ වූයේ එය අඳින්නට පටන් ගත් පසුවය. මම හොරෙන් වටපිට බැලීමි. බැලූ බැලූ අත කඩදාසිවල සිටින්නේ කලිසම් තාත්තලාය. එපමණක් ද ? ඒ තාත්තලා වැඩට යන්නේ ද කාර්වලය. මා එක්ක නිතර තරඟ වන ''සුමිත්‍රා" ගේ කඩදාසිය මතද යෝධයෙක් වන් කලිසම් මිනිසෙකි. මා ඒ දෙස බලනු දුටු ඈ ඇගේ අළුත්ම රිබන් පටි දෙක මට පෙනෙන සේ කොණ්ඩා දෙක ගස්සමින් මේසයට නැඹුරු වී තම කාර්යයෙහි නිරත වූවාය. දැන් ඉතින් සුමිත්‍රාගේ කලිසම් යෝධයා හා තරඟ කරන්නට නම් ම පියාණන් හටද කලිසමක් ඇන්ද විය යුතුමය. මම පැස්ටල් කූරක් ගෙන සුමිත්‍රාට නෙපෙනෙන සේ කඩදාසි අතින් වසා ගෙන කලිසමක් ඇඳ සිටින මිනිසකුගේ රූපයක් සමගින් මෝටර් රථයක් සිතුවම් කලෙමි. ඒ සුමිත්‍රා විසින් එය දුටුවොත් පාසල් ගුරුවරයෙක් වන මගේ පියා ඈ හඳුනන බැවින් ''ඒ ඔයාගෙ තාත්තා නෙවෙයිනෙ" යනුවෙන් නිරනුමානව මට පවසන බැවිනි. සැබැවින් ම ඒ මගේ තාත්තා නොවිණි. සුපුරුදු ජාතික ඇඳුම ඇඳ පා පැදියෙන් පාසල් යන තාත්තා වෙනුවට මොටර් රථයක් සමග සිටි කලිසම ඇඳි මිනිසා මා බියට පත් කලේය. මා විසින් මෙතෙක් ඇඳි චිත්‍ර වලින් අප්‍රසන්නම චිත්‍රය එය බැව් ඒ වනවිට මට වැටහී තිබිණ. චිත්‍රකර්ම ගුරුවරයා වෙනතක් බලා සිටින මොහොතකදී මම සැනෙන් මගේ චිත්‍රය ඔහුගේ මේසය මත තබා ශාලාවෙන් එලියට ආවෙමි. නිවසට පය තැබූ මොහොතේ සිටම මම හැකිතාක් උත්සහ කලේ තාත්තා මුහුණට මුහුණ මුණ ගැසීමෙන් වැළකීමටය. චිත්‍රයේ අලකලංචිය සෑම මොහොතකටම මගේ මනස පුරා දෝංකාර දෙමින් පැවතිණ. කුමන වැඩක නිරත වුවද දහවල පාසලේ දී මා විසින් චිත්‍රයේ ඇඳි කලිසම් මිනිසා ම දෙස ඔරවමින් බලා සිටින බවක් මට දැනිණ. කුරුමානම් අල්ලන පූසෙකුගෙන් බේරෙන්නට තැත් කරන මීයෙකු සේ තාත්තාගෙන් වහං වී සිටීමට මම බලවත් උත්සහක් දැරීමි.

එහෙත් සියල්ල පුපුරා ගියේ රාත්‍රියේ සාලයේ දිග මේසය අසළ චිමිනි ලාම්පු එළියෙන් අක්කාත් මමත් පාඩම් වැඩවල නිරත වූ මොහොතේදී ය. අප

25 වන පිටෙන්

NEW FUTURES TRAINING
VICSEG

PCA- CERTIFICATE III IN AGED CARE CHC30102 or
PSA - CERTIFICATE III IN PATIENT SERVICES HLT30802
One day per week for 22 weeks plus
a work placement
Great employment opportunities

Study grants available for eligible applicants
Contact: New Futures Training
11 Munro Street, Coburg 3058
Tel: 93832533 (BH)
nft@vicseg.com.au